ඔබ මේ සූදානම් වෙන්නේ
ත්‍රාසය, භීතිය සහා කුතුහලයෙන් පිරි

හෝහාර්

කියවීමටයි

ගෝෂාර්

©මුතුමුදලිගේ නිශ්ශංක - 2023

ISBN : 978-624-5552-17-7

ප්‍රථම මුද්‍රණය - 2019 ඔක්තෝම්බර්
දෙවන මුද්‍රණය - 2020 මැයි
තෙවන මුද්‍රණය - 2020 සැප්තැම්බර්
හතරවන මුද්‍රණය- 2021 පෙබරවාරි
පස්වෙනි මුද්‍රණය - 2023 දෙසැම්බර්

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි.

කතුවරයාගේ පූර්ව අවසරයකින් තොර ව මෙම ග්‍රන්ථයේ කිසිවක් ම, මොන ම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ - බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීම ද ඇතුළත් බව සලකන්න.

අක්ෂර සංයෝජනය හා සෝදුපත් පරික්ෂාව

අශෝක කුලතුංග

පිටු සැකසීම සහා චිත්‍ර

කාවින්ද්‍යා රත්නායක

කවර නිර්මාණය

කලන ගංගනාත්

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම.
27,18, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

ප්‍රකාශනය

පොත්මී ප්‍රකාශන

This book is dedicated to
My wife Lusine Serobyan
"Honey"
Who told me the story of real Gor
Love you Hon...

කුඩා දරුවකුගේ ජීවිතය වටා ගෙතී ඇති අතිශයින් භයංකාර වූ ද කුතුහලාත්මක වූ ද මෙම වෘත්තාන්තය ඔබට ලිවීමට මත්තෙන් මේ කතාවට මා අරෝපනය වූ ආකරය ගැන පාඨක ඔබ දැනගත යුතු ය.

දිනක් තම ළඟ ම මිතුරියකව මුණගැසීමට ගොස් නිවසට ආ මාගේ බිරිඳ දැඩි වික්ෂිප්ත භාවයකින් යුක්ත ව ඇඳෙහි වැතිර සිටියා ය. ඇයගේ මුහුණ සුදුමැලි වී ඇත. ඇය කුමක් හෝ පසුතැවිල්ලකින් සිටිනු ඇතැයි සිතූ මා ඇය වෙතට ළං ව එයට හේතුව විමසා සිටියෙමි.

ඇය තියුණු බැල්මකින් මා දෙස බැලුවා ය. ඇයගේ එකදු බැල්මෙන් ඇය මට පවසන්නට යන්නේ විශිෂ්ටතම කතාවක් යැයි මම දැන ගත්තෙමි. මා මෙතෙක් ලියූ සෑම කතාවක් ම මගේ බිරිඳ විසින් ම මා හට කියූ අපූරුතම සිදුවීම් බැවින් මෙයත් ඒ ආකාරයේ ම එකක් විය යුතු යැයි සිතූ මා එය දැනගනු රිසියෙන් ඈ දෙස බලා සිටියෙමි.

ඇය මා හට ගෝහා / ඊ නමින් ඔබ විසින් කියවන මෙම කතාව පැවසුවේ එවිට ය.

ඇයගේ හොඳ ම මිතුරියක වන රිප්සිමේ නමින් හඳුන්වන තැනත්තියගේ දරුවකුගේ ජීවිතයේ සිදුවුණු සහ තවමත් සිදුවෙමින් පවතින අතිශයින් ම අත්භූත, ප්‍රගුප්සාජනක සහ කුතුහලාත්මක සිදුවීම්වලින් යුත් මේ කතාව ඔබේ කියවීම උදෙසා මා මෙසේ ලියා පළකරමි.

පාඨක ඔබේ රසවින්දනය තීව්‍ර කරනු වස් මෙහි සමහර සිදුවීම් ප්‍රබන්ධයක් කොට මම නිර්මාණය කළෙමි. ඒත් ඔබ මෙය දැනගත යුතු ය. මෙය සත්‍ය සිදුවීම් දාමයක් මූලාශ්‍ර කොට ගෙන නිර්මාණය කළ වෘත්තාන්තයකි. ගෝහා සේ ම ගෝර් ද තවමත් ඔහු නොවුන් අතර ජීවත්වෙයි.

* මා මෙහි ඔහු + නොවුන් ලෙස හැඳින්වූයේ කුමක් දැයි ඔබ මෙය කියවගෙන යද්දී වටහා ගනු ඇත.

ආරම්භය

සිරකරුවන් හයදෙනකු රැගත් ක්ලේෆෝඩ්" සිරකඳවුරේ බස් රථයක් ඩිලිජ්යාන් හී පටු කඳුකර මාවතක් දිගේ ඉදිරියට ඇදෙමින් තිබිණ. මෙහි සිටින සයදෙනා ම මරණ දණ්ඩනය නියම වූ දරුණු අපරාධකාරයින් බැවින් ඉදිරි පැය දෙකක ගමනකින් පසු ඔවුන්ව යෙරෙවානයේ "සූකාර්" සිරකඳවුරට මාරු කරනු ඇත.

සූකාර් හැඳින්වූයේ "මරණයේ සිරකඳවුර" යන නමිනි. යෙරෙවානයෙන් පිට පළාත්වල දී මරණ දණ්ඩනය හිමි වූ සියලුම සිරකරුවන් අවසානයේ දී මාරු කරන්නේ සූකාර්වලට ය. එයට මාරුකර සතියකට පසු ඔවුන්ව එල්ලා මරා දමයි. සිරකරුවන් භීතියට පත් කළ මෙම සිරකඳවුරට මාරු කළ සෑම සිරකරුවකුගේ ම ජීවිතය මරණයෙන් අවසන් විය.

එහි ඇත්තේ මරණය ම පමණි. එය නිශ්චිත ය. දරුණු ම අපරාධකාරයින් වුව ද සූකාර්වල සිටින අවසන් දවස් කිහිපය ගත කළේ දැඩි පශ්චාත්තාපයෙනි. පෝරකයේ දී බෙල්ලට තොංඩුව වැටීමටත් පෙර සමහරු ඇඳුමෙ ම මලපහ කරගත්තෝ ය. තවත් සමහරුන්ගේ මූත්‍රා පොළොව මත ගලා ගියහ. තවත් සමහරු මරලතෝනි දී හඬා වැලපුණෝ ය. කොතරම් දරුණු යක්ෂයෙක් වුවත් සූකාර්වල දී මෙල්ල විය. යක්ෂයාටවත් මෙල්ල කළ ගත නොහැකි වූ ඔවුහු දෙවියන් ඉදිරියේ බැගෑපත් ව තමන්ව මරණයෙන් ගලවා දෙන ලෙස කන්නලව් කළහ. සූකාර්වල මරණය ඒ තරම් කෲර ය.

සිරකරුවන්

කලින් කීවාක් මෙන් දැඩි ලෙස ආරක්ෂාව යෙදූ ක්ලෙෆෝඩ් සිරකඳවුරේ බස් රථය ඩිලිජ්යාන් නමින් හැඳින්වූ කඳුකර මාවත දිගේ ඇදෙමින් තිබිණ. ඩිලිජ්යාන් මාවත ඉතාමත් පටු මාවතකි. මාවත දෙපස තිබූ තිරිඟු යායවල්වලින් එය පිරී තිබිණ. සමහර තැන්වල ගැඹුරු හෙල් ය; ඒ හෙල් අතර වක ගැසුණු වංගු ය. ඝන අන්ධකාරයත්, තැන් තැන්වල වැටී ඇති ස්වේත චන්ද්‍රාලෝකයත් හැරුණු විට මෙම මාර්ගයේ වෙනත් කිසිදු දෙයක් නොවී ය.

බෙන්ජ්‍රා ගුස්තාවෙව්, ඔහුව හැඳින්වූයේ "ගුස්තා" නමිනි. මුහුණ පුරා වැවුණු ඝන තඹ පැහැ රැවුලකින් යුක්ත වූ ඔහුගේ දකුණතේ රුසියන් මාස්තෝ කල්ලියේ පච්චයක් විය. රුසියානු මාස්තෝ කල්ලිය අර්මේනියාවේ සිට මෙහෙය වූ ඔහුව මිනිමැරුම් 17කට වැරදිකරු වී ඇත. බස් රථයේ සිටි අනිත් සිරකරුවන් මෙන් මොහුගේ ද පාදයන් සහා අත් යකඩ යදම්වලින් බැඳ දමා ඇත. මෙම යදම් බසයේ සිටි අනෙකුත් සිරකරුවන්ගේ යදම් සමග එකිනෙකට පැහී තිබිණ. එහෙයින් අනෙකාගේ අවසරයකින් තොරව කිසිවකුටත් සෙලවීමටවත් නොහැක. ඒ තරමට ම එම යදම් එකිනෙකා හා බැඳී ඇත.

ගුස්තාගේ දෙනෙත් කොළ පැහැති ඇතුළට නෙරා ගිය දෙනෙත් විය. ඔහුගේ තඹ පැහැ ඇහි බැමිවලට ඒවා වැසී තිබිණ. වීදුරුව හරහා අඳුරු ස්වේත වර්ණයෙන් ඇතින් පෙනෙන උස් වූ තිරිඟු යාය දෙස මොහොතක් විමසිල්ලෙන් යුක්තව බලා සිටි ගුස්තා ඔහු ඉදිරියේ සිටි හෙලන් දෙස බැලුවේ ය.

හෙලේනා ඉවානොව්නා, මොල්ඩෝවාවල උපන් හෙලේනාව කවුරුත් හැඳින්වූයේ හෙලන් යන නමිනි.

(ඇයට තුච්ච ඉතිහාසයක් ඇත. මෙම කතාවේ ඉදිරියට යෑමට කලින් ඔබ එය පැහැදිලිව දැනගත යුතු ය. නැතහොත් කාන්තාවක් පිරිමි සිරකරුවන් රැගත් බස් රථයකට ආයේ කෙසේ දැයි යන උභතෝකෝටික ප්‍රශ්නය ඔබටත් නැගෙනු ඇත.)

හේ නපුංසකයෙකි, මොල්ඩෝවාවල "බෙන්දර්" නම් වූ කුඩා ග්‍රාමයේ ඉපදුනු ඇගේ මුල් ම නම "ග්‍රිගෝර් තදෝව්සයාන්" නම්

විය.

කුඩා කාලයේ සිට ම ගැහැනු ගතිවලින් වර්ධනය වූ ග්‍රිගෙ ාර් තරුණ වියට පත්වත්ම, ඔහුගේ පියයුරු අනෙක් තරුණයින්ට වඩා වර්ධනය විය. මෙය අමතර ආදායමක් කරගත් ඔහු ස්ථීර නපුංසකයකු ලෙස ඇඟ විකුණන්නට පටන් ගත්තේ ය. කල් යත්ම ඔහු තම නම "හෙලේනා ඉවානොව්නා" ලෙස වෙනස් කරගත් අතර "හෙලන් " ලෙස අපරාන්වල ජනප්‍රිය විය.

ඇයට ඇහි බැමි නොතිබුණ අතර ඒ වෙනුවට කුඩා මකරුන් දෙදෙනකුගේ කළු පැහැ පච්චයන් දෙකක් ඒ මත විය. ගුස්තා දෙස බැලූ හෙලන් කට කොනකින් සිනාසුණා ය. ඈ සිනාසෙන විට ඇයගේ කටෙහි වූ තඹ යකඩයෙන් ආවරණය කර ඇති දත් පේළියත් එලියට නිරාවරණය විය. ඇයගේ පිටුපසට බැඳ තිබූ අත් ගාංචුවලින් ඇසෙන සියුම් හඬ යටපත් වී යන්නට ගුස්තා සෙමින් සෙමෙන් ගීයක් මිමිනුවේ ය.

හිරකරුවන් ප්‍රවාහනය කරන මෙම රථයේ සිරකරුවන් සයදෙනකු විය. තුන්දෙනකු එක පේළියකත් තවත් තුන්දෙනකු අනෙත් පේළියටත් හිඳගෙන සිටි අතර පේළි දෙකේ ම අවසානයේ එක් පොලිස් නිලධාරියකු බැගින් දෙදෙනකු දෙපැත්තේ හිඳගෙන සිටියහ. රියදුරු ආසනය සහ ඉදිරිපස ආසනයේ තවත් පොලිස් නිලධාරීන් දෙදෙනකු විය.

ගුස්තා ටික මොහොතකින් තම මිමිනීම නැවත්විය. හෙලන්ගේ අත සෙමෙන් සෙලවෙන අයුරුත් ඇයට එහා පසින් සිටි මූසා ඇය වෙත මඳක් ළං වන අයුරුත් ඔහු දුටුවේ ය.

ඔහු මූසා දෙස බැලීය. මූසා ඉරාන සරණාගතයෙකි. හිසෙහි ඉදිරිපස තට්ටයකින් යුක්ත වූ ඔහු මුහුණ

පුරා ම රැවුල වවා සිටියේ ය. ටික මොහොතකින් ගුස්තා දෙස බැලූ මූසා සියල්ල සූදානම් බව කීමට ඔහුගේ හිස මඳක් ඉහළට ඔසවා ගුස්තාට සංඥාවක් කළේ ය. හෙලන් සහා මූසා තම ගාංචූ ලිහාගෙන ඇති බව නිශ්චිතව ම දැනගත් ගුස්තා තම සැලැස්මේ අවසන් කොටස ක්‍රියාත්මක කිරීමට පෙර මොහොතකට දෙනෙත් වසා ගත්තේ ය.

මාරයාට මරණය දැන්විය යුතු ය. මෙය අසාර්ථක වුවහොත් එක ම වෙඩි උණ්ඩයකින් තමා පරලොව යා හැක. ගුස්තා දැස් පියාගෙන තම මනසින් ඩිලිජ්යාන් මාර්ගයේ වංගුව හරියට ම මැන ගත්තේ ය. හෙලන් සහ මූසා ඊළඟ තත්පරයේ සිදුවීමට නියමිත සියලුම දේට මුහුණදීමට සූදානම් වී සිටියෝ ය.

රථය වංගුව හරවත්ම වැරෙන් හිටගත් ගුස්තා පොලිස් නිලධාරියාගේ ඇඟට කඩා පැන්නේ ය. පොලිස් නිලධාරියා අත වූ තුවක්කුව උදුරා ගත් ඔහු එයින් තමා ඉදිරියේ වූ අනිත් පොලිස් නිලධාරියාට වෙඩි තැබීය.

වෙඩි උණ්ඩය ඔහුගේ බෙල්ල පසාරු කරගෙන ගියෙන් ඔහුව බිම ඇද වැටුණේය. තුවක්කුව හැරවූ ඔහු එහි මිටෙන් තමා අසල වූ පොලිස් නිලධාරියාට වැරෙන් ගැසුයෙන් ඔහුව ද එතන ම ඇද වැටිණ. මේ සියල්ල සිදුවූයේ ක්ෂණිකයිනි. හෙලන් බඩ ගා විත් බිම වැටුණු පොලිස් නිලධාරියාගේ තුවක්කුවෙන් ඉදිරිපසට වෙඩි තැබුයෙන් මොහොතකින් බස් රථය තුළ දැඩි වෙඩි හුවමාරුවක් විය.

බස් රථයේ විදුලි බුබුලු සම්පූර්ණයෙන් ම වෙඩි උණ්ඩවලින් බිඳී ගියෙන් වෙඩි හඬත්, වෙඩි උණ්ඩවලින් පිටවෙන දිලිසෙන ආලෝකයත්, වෙඩි වැදුණු සිරකරුවන්ගේ මරළතෝනියත් හැරෙන්නට වෙන කිසිවක් එහි නොවී ය.

බසය පැදවූ පොලිස් නිලධාරියාට වෙඩි වැදෙන්නට ඇත. බසය එක්වර ම පෙරළී ගියේ ය. වට කිහිපයක් පෙරළී ගිය එය මාවතේ එහා පස වූ තිරිඟු යායේ නතර විය. ටික මොහොතකින් බසයේ ඉදිරිපස ගිනිගන්නට පටන් ගත්තෙන් මුළු බසය ම දුමෙන් පිරී යන්නට විය.

ගුස්තා තම අත වූ තුවක්කුවත් සමග මුනින් අත පෙරළී තිබුණු

බසයෙන් බඩගා එලියට පැන්නේ ය. ඔහුගේ පාදයෙහි වූ යදම් තවමත් බැඳ තිබුණෙන් එයත් සමග ම ඔහුට එහා පසින් සිටි සිරකරුව ද බිම ඇද වැටිණ. වෙඩි වැදීමෙන් ඔහු පන අදිමින් සිටියේ ය. ගුස්තාව් දෙස බැලූ ඔහු තමන්ව බේරාගන්නා'යි කියනවාක් මෙන් කට සෙලවී ය.

ඒත් පණ අදින්නකු කරගාගෙන පලා යෑම ගුස්තාගෙ සැලසුමේ නොවී ය. තුවක්කුව හැරවූ ගුස්තා ඔහුව එතන ම මරා දැම්මේ ය. එසැනින් ම තම පාදයෙහි වූ ගාංචුවට වෙඩි තැබූ ඔහු පාදය එයින් මුදවා ගෙන බස් රථයේ ඉදිරිපසට ගියේ ය. වෙඩි උණ්ඩ කිහිපයක් නික්ම යනු ඇසිණ. බස් රථයේ ඉදිරියෙහි පණ අදිමින් සිටි පොලිස් නිලධාරියෙක් වී නම් ඔහුව එතන ම මැරී යන්නට ඇත.

බස් රථය ගිනිගන්නට පටන් ගත්තේ ය. බසයේ ඉදිරිපසින් ආරම්භ වුණු ගින්න මොහොතකින් පිටුපසටත් ආයෙන් තවත් සුලු මොහොතකින් බස් රථය පිපිරී යන බව ගුස්තා දැනගෙන සිටියේ ය. ඔහු බස් රථය ඇතුළතට එබී හෙලන්ව බස් රථයෙන් ඉවතට ගෙන ආවේ ය. මූසා ද බඩ ගාගෙන එයින් එලියට ආවේ ය. වෙඩි වැදීමෙන් ඔහුගේ පාදයකින් ලේ වැගිරෙමින් තිබිණ. ඔහු පසුපසින් තවත් සිරකරුවකු එලියට ආවේ ය. ඔහුගේ එක් කනක් වෙඩි උණ්ඩයකින් සම්පූර්ණයෙන් ම වෙන්වී ගොස් තිබුණෙන් ඔහුගේ මුහුණේ එක් කොනකත් බෙල්ලත් පුරා රුධිරය විසිරී තිබිණ

ඔහු ශෝරා නමින් හැඳින්වූ ගුම්රී නගරයේ දාමරිකයකු වූ අතර, උස දැඩි සිරුරකින් යුක්ත වූ ඔහු බස් රථයෙන් එලියට විත් ගුස්තාගේ උරහිසට තට්ටුවක් දැමීය. බස් රථය ගිනි පුපුරු නන්වමින් දැවෙන්නට පටන් ගත්තේ ය. ටික මොහොතකින් ම විශාල හඬක් නගමින් පිපුරුණු එය, ගිනි ජාලාවක් අඳුරු අහසට එක් කොට ඊළඟ විනාඩි කිහිපයේ දී නිසොල්මන් විය.

ගුස්තා ඉරිඟු ගස් අතරින් ඇතින් පෙනෙන නොපෙනෙන මානය දෙස බැල්මක් හෙලීය. තවත් ටික මොහොතකින් මෙතනට මිනිසුන් වට වෙනු ඇත. ඊට පෙර යාහැකි උපරිම දුරක් යා යුතු ය. ඩිලිජ්යාන් ගම් මායිමෙන් පසුව ඇත්තේ ස්පිතාක් නමින් හඳුන්වන කඳුවලින් ආවරණය වුණු කුඩා ගම්මානයකි. හිරු එළිය වැටෙන්නට

කලින් ස්පිතාක්වලට යාගත හැකි නම් එතනින් වෙනත් ආරක්ෂිත ස්ථානයකට පලා යා හැක. සියල්ලෝම දුවන්නට පටන් ගත්හ. ගුස්තා සහ හෙලන් මූසාවත් කර පින්නාගෙන දුව යද්දී , ශෝරා ඔහුගේ ලේ වැක්කෙරෙන කනත් අල්වාගෙන ඔවුන් පසුපසින් දුව යන්නට විය.

"ගෝර්"

"නැහැ ...ගෝහා"

"ගෝර්" එමිලින් යළිත් මිමිණුවාය.

අරාරත් ඇයගේ දෙනෙත් දෙස බැලීය. ඇය සිනාසුණා ය. ඔහු ළඟට ළං වූ ඇය ඔහුගේ පපුවට හිස තබාගත්තා ය. අරාරාත් එමිලින්ගේ හිසට හාද්දක් දුන්නේ ය. කවුලුවෙන් ඈත පෙනෙන චන්ද්‍රයා දෙස බලා සිටී ඇ මෙසේ කීවා ය.

"පුතෙක් නම් ගෝර් , දුවෙක් නම් ගෝහා"

"හ්ම්. මතකද මම විවහා වෙන්න කලින් ඔයාට පොඩි පොතක් දුන්නා." අරාරාත් ඇසීය.

අරාරාත් සහා එමිලින් විවහා වී වසර 4ක් පමණ ගත වී ඇත. ඔහු ඇය හා පෙමින් බැඳී සිටි මුල් ම කාලයේ දී වරක් ඇයගේ උපන් දිනයට කුඩා පොතක් දුන්නේ ය. එය ලියා තිබුණේ ඔවුන්ට අනාගතයේ දී උපදින පුංචි දරුවා වෙනුවෙනි.

ඇය එය කෙසේ අමතක කරන්න ද එය ඇගේ ජීවිතයේ සුන්දර ම කාලය යි, එමිලින්ගේ මුවට සිනහවක් නැගින.

"ඔයා ඒක ලියලා තිබ්බේ දුවෙක්ට"

"හ්ම් අරාරත් මිමිනීය. ගෝහා ට "

"ඒත් මට ඕනේ පුතෙක්...අපිට කොහෝමත් උපදින්නේ පුතෙක් මම ඒක දන්නවා"

ඇය එය කීවේ කවටකමට ය. එසේ කියත්ම අරාරාත් සිනාසී ඇයට හාද්දක් දුන්නේ ය.

ඇය අරාරාත්ව තවත් තුරුලු කරගත්තා ය.

අරාරාත් ඔහුගේ අත ඇයගේ කුස මත තැබීය. ඇයගේ කුස තුළ සිටින දරුවා දුවෙක් වුණත් පුතෙක් වුණත් ඒ දරුවා නීරෝගී වේවා යි ඔහු ප්‍රාර්ථනා කළේ ය. මීට මාස කිහිපයකට පෙර එමිලින් තමන් ගැබ් ගෙන ඇතැයි කියද්දී අරාරාත් අප්‍රමාණ ලෙස සතුටු විය. ඒ සතුට අදත් මෙම මොහොතෙත් ඔහුගේ හදවත තුළ ඉතිරිව ඇත.

"දුවෙක් නම් අපි එයාට ගෝහා කියමු, පුතෙක් නම් අපි ගෝර් කියලා නම තියමු " ඇය යලිත් මිමිනීය.

"හා " ඔහු කීවේ ය.

***

අඩි හයකටත් වඩා උස්වූ තිරිඟු යාය හරහා සිරකරුවන් පස්දෙනා දුව එමින් තිබිණ. මේ වන විටත් කිලෝමීටර තුනකටත් වඩා ඔවුන් දුව යන්නට ඇත. ගුස්තාව් ඩිලිජ්යාන් මායිම හොඳින්

දැන සිටියේ ය. ඔහුන්ගේ අවසන් තුරුම්පුව වූ ස්පිතාක් නගරය අහසෙහි ඡායාවක් මෙන් ඇතින් පෙනෙන කඳු පන්තියෙන් එහා පස ඇත. එතැනට යාමට නම් තවත් කිලෝමීටර ගාණක් දිව යා යුතු ය. ගුස්තා නැවතුණේ ය. ඔහුගේ අතෙහි වාරුවෙන් එල්ලී පැමිණි මූසාව යාය මතට තල්ලු කර දැමූ ඔහු තම තුවක්කු බටය ඔහුට මාන කළේ ය. එයින් වෙඩි උණ්ඩයක් නික්මී ගියේ ය. ඒත් හෙලන් එක්වර ම ඔහුගේ තුවක්කුවට පා පාරක් ගැසුයෙන් තුවක්කුව යායෙ ම පැත්තකට විසි වී වැටිණ.

"උඹට එහෙම කරන්න බැහැ ගුස්තා. මූ අපේ එකෙක්. පැනලා ආවේ උඹ විතරක් නෙමෙයි අපි සේරම"

හෙලන් ඇය අත වූ තුවක්කුව ගුස්තා දෙසට මානමින් පැවසුවා ය.

"තව ටිකකින් පොලිස් බල්ලෝ එනවා. උන් මූගේ ලේවලට ඉවකරයි. අපි අර කඳු මායිමෙන් එහා පැත්තට ගියත් මූගේ ලේ පාර දිගේ උන් එහාට ඒවී. බලපන් ගැනියේ, මූගේ කකුලෙන් යන ලේ අපි ආපු පාර දිගේ ම වැක්කිරිලා ඇති "

ගුස්තා මූසාගේ පයට පහරක් ගසමින් පැවසීය. ශෝරා තමා ඇඳ සිටි කමිසය ගලවා එයින් කැල්ලක් ඉරා එයින් මූසාගේ තුවාලය හොඳින් වැසෙන්නට බැන්දේ ය. එසේ බඳින ගමන් ගුස්තා දෙස බැලූ ඔහු,

"ගුස්තා මූ අපිත් එක්ක ආවේ. අපි යන තැනකට මූත් යන්න ඕනේ. තුවාලයෙන් ලේ වැක්කෙරෙන එක තව ටිකකින් නතර වේවී" යි කීවේ ය.

හෙලන් දෙස බැලූ ගුස්තා යායේ වැටී තිබුණු තුවක්කුව අතට ගත්තේ ය. මූසා ඔහු ඊළඟට කුමක් කරාවි දැයි බියෙන් යුක්තව බැගෑපත් මුහුණකින් ඔහු දෙස බලා සිටියේ ය. තුවක්කුව කරෙහි තබාගත් ගුස්තා නිමක් නොපෙනෙන අන්ධකාරය දෙස බැලීය.

"තව පැය දෙකක් මේ විදියට ගියොත් අපිට ස්පිතාක් කඳු මායිමට යා ගන්න පුළුවන් වේවී"

කියූ ඔහු තිරිඟු යාය පීරමින් ඉදිරියට ඇදෙන්නට විය. හෙලන්ගේ අතට බර වූ මූසා ඉතිරි ව ඇති දුරත් කෙසේ හෝ යාමට සිතා නැගිට්ටේ ය. ඔහු එසේ කළ යුතු ය. නැතහොත් ගුස්තා ඔහුගේ

හිසට උණ්ඩයක් බස්සවා ඔහුව පරලොව යවනු ඇත. ඔහු එය දැන සිටියේ ය. මෙවන් මොහොතක දුබලයාව නිසැකව ම පරාද වෙයි. එය නිශ්චිත ය. මූසා යළිත් හිටගත්තේ ඔහුගේ ඉදිරියෙහි පෙනෙන මරණයෙන් ගැලවීමට ය.

***

යාය දිගේ කිලෝමීටර භාගයක් පමණ ගිය තැන යාය කෙමෙන් කෙමෙන් වියැකී ගොස් එය බුරුල් වී ගියේ ය. ටික දුරක් යත් ම එය මඩ කඩිත්තක් සේ බොල් වී ගිය අතර ඔවුහු වතුර පිරුණු ගොහෝරුවකට ආවෝය.

"පරිස්සමෙන්.... එරෙන්න පුළුවන් ..."

ශෝරා කෑගැසීය.

චන්ද්‍රාලෝකයෙන් දිය පිරුණු ගොහොරුව ස්වේත වර්ණයෙන් දිලිසුම් දුන්නේ ය. ගොහොරුව පසුවුණු පසු ඔවුන් තනි බිම් යායකට පැමිණියේ ය.

"අතන එළියක්"

ශෝරා ඈත පෙනෙන කුඩා ආලෝකයක් දෙස බලා කෑ ගැසීය.

"ගෙයක් " හෙලන් මිමිනීය.

ගුස්තා ඒ දෙස බලා සිටියේ ය.

මූසාගේ මුහුණෙහි සැහැල්ලු සිනහා මාත්‍රයක් නැගින.

ඔවුන් සියල්ලම ආලෝකය පෙනුණු ඉසව්වට දිව ගියෝ ය. මෙම නිවස පිහිටා තිබුණේ තනි ඉරිඟු යායක් මධ්‍යයේ නිසා මොහොතකට හෝ විවේකයක් ගැනීමට මෙය හොඳ තැනක් වනු ඇත.

නිවස පිහිටි තැනිතලා බිම් කඩට ආ ඔවුහු මාන බැලූහ. මෙවන් ගොවිපළවල් තුළ දරුණු දඩ බල්ලන් ඇති කරන නිසාවෙන් ඔවුන් පරිස්සම් විය යුතු ය. ඒත් එහි අනතුරක සේයාවක් හෝ ශබ්දයක් නොවී ය.

ගුස්තා කෙමෙන් කෙමෙන් නිවස දෙසට ඇදෙන්නට විය. නිවස පේන මායිමට ගිය ඔහු නතර වී නිවසට එහා පසින් පෙනෙන

කුඩා ගරාජය දෙස බැලීය.

"මගෙත් එක්ක වරෙල්ලා"

හිසින් සං කළ ඔහු නිවස දෙසට යනු වෙනුවට ගරාජය දෙසට යන්නට පටන් ගත්තේ ය.

කිසිදු ශබ්දයක් නැත. නිවසට එහා පසින් වූ මෙම කුඩා ගරාජය ලීයෙන් සාදා තිබිණ. එහි ප්‍රධාන දොර විශාල යකඩ බාරුවකින් අගුලු දා තිබුණෙන් තම තුවක්කුව අනෙක් පස හැරූ ගුස්තා එයට වැරෙන් පහරක් ගැසුයෙන් බාරුව ගැලවී බිම වැටිණ. ඔහු දොර විවර කළේ ය.

ඒ තුළ ඔවුන් දුටු දෙයින් ඔවුන්ගේ දෙනෙත් දිලිසුම් දෙන්නට පටන් ගත්තේ ය. එය ට්‍රැක්ටරයකි.

"දෙයියෝ මන් දිහා බැලුවා." මූසා කෑ ගැසීය.

ඔහු නොන්ඩි ගසමින් ට්‍රැක්ටරය දෙසට දිව ගියේ ය.

"මේකේ ගියොත් අපිට තව පැය භාගයකින් කන්දෙන් එහා පැත්තට යන්න පුළුවන්" ශෝරා ගුස්තා දෙස බලා කීය.

ගරාජය තුළට ගිය ශෝර් එහි වූ විදුලි පන්දම දැල්වීය.

පැය ගණනක් අන්ධකාරයේ ආ ඔවුන්ගේ දැස් එක්වර ම පැමිණි මෙම එළියෙන් මොහොතකට නිලංකාර වී ගියෝ ය.

ඔවුන්ගේ ඉදිරියෙහි තිරිඟු ප්‍රවාහනය කරන ලාඩා වර්ගයේ ට්‍රැක්ටරයක් දිලිසෙමින් ඇත. එහි බදය තනි ඇලුමිනියම්වලින් සාදා තිබුණෙන් ආලෝකය වැටීමෙන් එය දිලිසුම් ස්වභාවයක් ගත්තේ ය.

අරාරාත්

අරාරාත්ව නින්දෙන් එක්වර ම අවදි විය. ඔහුට ගොවිපොළ දෙසින් ශබ්දයක් ඇසින. කුමක් හෝ දෙයක් සිදුවන බව ඔහුට

නිට්ටාවට මෙන් දැනී තිබිණ. ඔහු තමන්ට එහා පසින් නිදාගෙන සිටි එමිලින් දෙස බැලීය. ඇය සිටින්නේ ගැඹුරු නින්දක ය. ඇයව අවදි කළ යුතු නැත. කටත් ඇරගෙන නිදාගෙන සිටින එමිලින්ව දුටු අරාරාත්ගේ මුහුණින් සියුම් සිනහවක් මතුවිය.

"පිස්සු කෙල්ල" ඔහු සෙමින් මිමිනුවේ ය.

එමිලින්ගේ දෙතොලට ළං වූ ඔහු ඇයට සෙමින් හාදුවක් දී ඇඳෙන් නැගිට්ටේ ගොවිපළ දෙසට ගොස් බැලීමට සිතාගෙන ය.

නිවසේ විදුලි පහන් නොදැල්වූ ඔහු නිවසේ සාලයේ තිබුණු කවුළුවෙන් ගොවිපළ දෙස බැලීය. තම නිවසට එහා පසින් වූ ගෑරේජයේ විදුලි පහන් දැල්වී ඇති බව ඔහු දුටුවේ මේ මොහොතේ දී ය.

තමන් යළිත් නිවසට එන විට විදුලි පහන් නිවා පැමිණි බව ඔහුට හොඳට ම විශ්වාස ය. එසේ නම් කවුරු හෝ ගෑරේජය තුළ ඇත. ඔහු සෙමෙන් ගොස් නිවසේ ප්‍රධාන දොරළඟ හේත්තු කොට තිබූ තුවක්කුව අතට ගෙන එහි පතරොම් ඇත්දැයි විවෘත කර බැලීය. එය පිරී ඇති බැව් නිශ්චිතව ම දැනගත් ඔහු සෙමෙන් දොර විවර කොට ගෑරේජය පැත්තට ගියේ ය.

***

මූසාත්, ශෝරාත් ට්‍රැක්ටරය පණගන්වන්නට උත්සහා කරද්දී ගුස්තා ගෑරේජයේ කවුළුව අසල අන්ධකාරයෙන් පිරී ගිය මානයක හිටගෙන නිවස දෙස බලාගෙන සිටියේ ය. ඔහුට යමක් ඉව වැටී තිබිණ. ඔහු දුටු දෙය නිවැරදි නම් තවත් සුළු මොහොතකින් ඔහුට එම ඡායාව දැකගත හැකි වනු ඇත.

ඔහු අන්ධකාරයට ඉව ඇල්ලීය. මොහොතකින් ඔහුගේ දෙනෙත විශාල වී ගියේ ය. කිසිවකු හෝ අන්ධකාරය තුළින් ගෑරේජය දෙසට

එන බැව් ඔහු දැනගත්තේ ය.

"ෂ් ....."

ඔහු ට්‍රැක්ටරය අසල සිටි එවුන්ට නිශ්ශබ්ද වෙන්නැ'යි අණ කළේ ය. කවුළු බරාදයට හේත්තු වූ ඔහු තුවක්කු බටය ඒ අසල බිම තැබීය.

"හෙලන් උඹ ශෝරාත් එක්ක පිටුපස්සෙන් පලයන්"

ඔහු හෙලන්ට කීය.

මූසා ට්‍රැක්ටරයෙන් බිමට විත් ඒ අසල වූ විශාල කැත්තක් වැනි යකඩයක් ඔහු අතට ගත්තේ ය.

අරාරාත් ගරාජය අසලට ළං වෙත් ම ගුස්තා ඉදිරිපස දොර ළඟට පැමිණියේ ය. ගැරේජය ඉදිරිපස සිටගෙන සිටින ගුස්තාව දුටු අරාරාත්,

"කවුද උඹ? මොනවද උඹලා මෙතන කරන්නේ?"

තුවක්කුවත් අමෝරාගෙන කෑ ගැසුවේ ය.

"මහත්මයා .. අපි ආපු වැඩේ කරගෙන ඉවරයි. අපි දැන් යන්න ලෑස්ති වෙන්නේ." ගුස්තා ගැරේජයෙන් ඉවතට සෙමින් පියවර තැබුවේය.

"මොන වැඩේ ද ? එලියට වරෙන් නැත්නම් මම වෙඩි තියනවා"

ගුස්තා, ඔහු පිටුපස සිටි මූසා දෙස බලා එලියට එන්නෑයි සං කළේ ය. ඔහු සෙමෙන් සෙමෙන් ගැරේජයෙන් ඉවතට එන්නට විය. මූසා අත වූ යකඩ කැත්ත දුටු අරාරාත්

"ඕක බිමින් තියපන් " හී කැගැසීය.

ඔහු එය සෙමෙන් බිම තැබීය. ගුස්තා ඔහුගේ අත් දෙක ඉහළට ඔසවාගෙන කෙමෙන් කෙමෙන් අරාරාත් ළඟට එන්නට විය.

"මහත්මයා.. අපිට යන්න දෙන්න අපෙන් ඔබට කරදරයක් වෙන්නේ නැහැ.. " ඔහු කීවේ ය.

"දණ ගහපන්. ළඟට එන්න එපා. ඔතන ම දණ ගහපන්" අරාරාත් කෑ ගැසුවේ ය.

ගුස්තා නතර විය. ඔහුගේ දෙනෙත් එක හෙල්ලේ ම අරාරාත්

වෙත එල්ල වී තිබිණ. ටික මොහොතකින් ඔහුගේ මුහුණෙන් සියුම් සිනාහවක් මතුවිය. ඒත් සමග ම පිටුපසින් පැමිණි වෙඩි උණ්ඩයක් අරාරාත්ගේ පපුව පසාරු කරගෙන ගියෙන් ඔහුව එතන ම බිම ඇද වැටිණ.

අන්ධකාරය තුළින් මොහොතකින් හෙලන් සහ ශෝර් මතුවිය. හෙලන්ගේ මුහුණේ ගැඹුරු තෘප්තියක් තුළින් නැගෙන සිනහවක් විය. ශෝරා ඉදිරියට විත් අරාරාත්ගේ නිසල වූ දේහයට පයින් ගසා බිම වැටී තිබුණු තුවක්කුව ඔහු අතට ගත්තේ ය.

"රුසියානු භාණ්ඩයක්" ශෝර් ගුස්තා දෙසත් තුවක්කුව දෙසත් බලා සිනාසුණේ ය.

"මේ අන්ධාකාරේ උඹ ඉලක්කේ හරියට ම ගත්තා හෙලන්"

ගුස්තා හෙලන් ළඟට විත් ඇයගේ උරහිසට අතක් තබා ඇයගේ මුහුණට ළං විය.

"මම ඒකයි උඹට කැමති... උඹ පට්ට ම බඩුවක්" ඔහු හෙලන්ගේ පියයුරු දෙස බලමින් ඇයව ඔහුගේ පපුවට තුරුලු කරගත්තේ ය.

***

වෙඩි හඬ නිදාගෙන සිටි එමිලින්ට ඇසුණා ය. ඇයව තිගැස්සී අවදි විය. ඇඳ අසල තිබුණු කුඩා විදුලි ලාම්පුව දැල්වූ ඇය අරාරාත් සිටී දැයි බැලුවා ය. ඔහු එතන නැත. තමන්ට ඇසුණේ වෙඩි හඬක් බව ඇය නිශ්චිත ය. අරාරාත් නිවසින් පිටතට යන්නට ඇත. මධ්‍යම රාත්‍රියේ වෙඩි හඬක් ඇසෙන්නට හේතුවක් නොමැත. ඉක්මනින් ම ඇඳෙන් නැගිට ගත් ඈ සාලයේ තිබුණු විදුලි පන්දම ද රැගෙන නිවසින් එලියට ආවා ය.

"අරාරාත් අරාරාත් ... "

නිවසින් එලියට ආ ඇය කෑ ගැසුවා ය....

එමිලින්ගේ කටහඬ කන වැකෙත් ම ගරාජය තුළට යමින් සිටින ශෝරා දෙස බැලූ ගුස්තා,

"ශෝරා ඔය ලයිට් එක නිවපන් " යැයි පැවසීය.

ගරාජය තුළට දිව ගිය ශෝරා විදුලි ලාම්පුව නිවා දැමුයෙන් මුළු ප්‍රදේශය ම යළිත් අන්ධකාර වී ගියේ ය.

ගැරේජයේ විදුලි ලාම්පුව නිවී යනු ඇත සිටි එමිලින් දුටුවා ය. නිසැකව ම අරාරාත් විදුලි ලාම්පුව නිවා යළිත් නිවසට ඒමට පිටත් වෙන්නට ඇත. ඈ සිතුවා ය. විදුලි පන්දම් එළිය ඒ පැත්තට මාන කරමින් ඇය හෙමින් හෙමින් ඒ දෙසට ඇදිණ.

"හෙලන් මයේ කෙල්ලේ .. උඹට ඒක පේනවා ද ? "

ඇතින් එන විදුලි පන්දම් එළිය දුටු ගුස්තා හෙලන්ගේ කනට කර පැවසීය.

"හ්මී.. " ඇය මිමිනීය.

ගුස්තා තමන්ගේ අත හෙලන්ගේ බඳ වටා යවා ඇයව තම තුරුලට ගෙන ඇය අත වූ තුවක්කුව ඉහළට එසවිය.

"ඉලක්කයට ම අල්ලපන් එක වෙඩිල්ලකින් උඹ ඉවර කරන්න ඕනේ.. "

ඔහු තම දිව හෙලන්ගේ බෙල්ල දිගේ ගෙන ගොස් ඇයගේ කන ළඟින් නතර කළේ ය. අන්ධකාරයේ ම තුවක්කු බදයේ අවසානයත් එක එල්ලේ ම පෙනෙන විදුලි පන්දම් එළිය දෙස ඔහු බැලුවේ ය.

"දැන් " යැයි මිමිනුවෙන් හෙලන් එක්වර ම තුවක්කුවේ කොකා ගැස්සුවා ය.

විශාල වෙඩි හඬක් මුළු පරිසරය ම දෝංකාර කොට නික්ම ගිය අතර එක්වර ම ඇතින් පෙනුණ ආලෝකය බිම පතිත විය. ගුස්තා හෙලන්ගේ පියයුරු තම දැතින් ම මිරිකා ඇයව ඉහළට ඔසවා ගත්තේ ය. තුවක්කුව බිමට විසිකළ හෙලන් ගුස්තාගේ මුහුණට ළංවී ඇයගේ පාදයන් ඔහුගේ බඳ වටා යවා ඔහුගේ තොල් උරා ගත්තා ය.

"මගේ කෙල්ල උඹ හරියට ම ඒක කළා....."

ගුස්තා ඇයගේ තොල් උරා ගන්නා ගමන් සිහිවිකාරයෙන් මන්ත්‍රයක් ජප කරන්නකු මෙන් මිමිනුවේ ය.

බිම වැටුණු විදුලි පන්දම කෙමෙන් නිවීයන්නට පටන් ගත්තේ ය. පොළව දිගේ රෑරා පැමිණි රුධිරයෙන් මොහොතකින් එය වැසී ගියේ ය. එමිලින්ගේ පපුවෙන් නික්මුණු රුධිරය පොළව පුරා ඇදී යද්දී ඇය ඒ මත පණ අදිමින් සිටියා ය.

එමිලින්

එමිලීන් දෙනෙත් විවර කළා ය. විවර කරත් ම ඇයගේ දෙනෙත් දැඩි ස්වේත වර්ණ ආලෝකයෙන් පිරී ගියෙන් ඇය යළිත් මොහොතකට දෙනෙත වසා ගත්තා ය. එක්වර ම ඇය අසල වූ යන්ත්‍රයකින් ඇසෙන "බීප්" හඬ ටිකෙන් ටික දැඩිව ඇසෙන්නට වූයෙන් ඇය දැස් විවර කොට වට පිට බැලීය.

ඇය අවදි වී ඇති බැව් දුටු හෙදිය ඇය අසලට විත් ඇයගේ අත අල්වා ගත්තා ය.

"මිසිස් එමිලීන් " ඇයට හෙදියගේ කටහඬ ඇසින.

ඈ හෙදියගේ අත අල්වාගෙන ඇඳෙහි හිඳ ගැනීමට යත්න දැරීය. ඒත් ඇයගේ පපු පෙදෙසෙන් දැඩි වේදනාවක් පැමිණියෙන් ඇය වේදනාවෙන් ඇඹරුණා ය.

"හිඳගන්න එපා. තවම තුවාලය හොඳ වෙලා නැහැ"

"තුවාලය ?"

ඇය තම පපු පෙදෙස අත ගෑවා ය. සිදුවූ සියල්ලම එකින් එක ඇයගේ මනසට ගලාගෙන එන්නට වූයෙන් ඇය මොහොතකින් තම හිස අල්වා ගෙන ඇඳෙහි පිටුපසට බර විය.

"අරාරාත් " ඇය මිමිනුවා ය.

එක්වර ම ඇය වට පිට බැලූවා ය. සිදුවූ කිසිවක් ඇයට හරි හැටි මතක නැත.

රාත්‍රියත්, අන්ධකාරයත්, ඒ මතින් දුටු ඡායාරූත් පමණක් ඇයගේ මනසේ අවශේෂ වී තිබිණ.

"කෝ මගේ මහත්තයා. කෝ අරාරාත් ?"

හෙදිය කිසිදු පිළිතුරක් නොදුන්නා ය.

ඇයට තම කුස තුළ වූ දරුවා මතක් විය. ඇය තම කුස අත ගෑවා ය.

"මගේ දරුවා... මගේ දරුවා.. .කෝ මගේ දරුවා "

ඇයගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඇය හෙදියගේ දෑත අල්වා ගෙන කෑ ගැසුවා ය.

"මිසිස් එමිලීන් සංසුන් වෙන්න.... සංසුන් වෙන්න"

"කෝ මගේ දරුවා ?"

ඇයගේ දෙනෙතෙහි කඳුළු පිරී තිබිණ. ඇය හෙදියගේ උරහිස අල්වා සෙලෙව්වා ය.

"කෝ මගේ දරුවා? "

"මිසිස් එමිලීන්ට වෙඩි වැදිලා රෝහලට ගේද්දීත් දරුවා ගබ්සා වෙලා තිබුණේ. අදට සතියක් වෙනවා දැන් තමයි ඔයාට සිහිය ආවේ. "

ඇයගේ දෙනෙතින් කඳුළු බේරිණ. හෙදිය ඇයගේ බුරුලු වී ගිය සේලයින් ටියුබය යළිත් තද කළා ය. එමිලීන් හෙදියගේ දෑස දෙස බැලුවා ය. ඇය මෙය දැන ගත යුතු ම ය.

"අරාරාත් " ඇයගේ දෙනෙතෙහි වූයේ අවිනිශ්චිත වූ හිස් බැල්මකි.

මට සමාවෙන්න මිසිස් එමිලීන්. ඔයාගේ මහත්තයාව බේරග

න්න බැරිවුනා... "

එමිලින්ගේ දැස විශාල විය. ඇයගේ සිරුර සීතල වී යන අයුරු ඇයට දැනිණ.

"ඔයා දැන් විවේක ගන්න ඕනේ. හැම දේම හරි යයි. දැන් විවේක ගන්න "

කියූ හෙදිය එමිලින්ව යළිත් කොට්ටයට බර කළා ය. ටික මොහොතක් එමිලින්ගේ හිස අත ගෑ ඇය තම අතෙහි වූ එන්නත එමිලින්ගේ අතෙහි වූ කුඩා බටය තුළට යැවීය.

එමිලින් සන්සුන් විය. කෙමෙන් කෙමෙන් ඇයගේ දැස වැසී ගියා ය. ඇය නිද්‍රාවට පත්වන්නට ඇත.

මරණය සහ ඉපදීම

සති කිහිපයක් ඉකුත් වී ගියේය..

එමිලින් රෝහලෙන් යෙරෙවාන්වල තිබූ ඇයගේ මවගේ නිවසට පැමිණියා ය. ඩිලිජ්යාන්වල ඇයට කිසිවකුත් නැත. අරාරාත්ගේ අවසන් කටයුතු ඩිලිජ්යාන්වල තිබුණු ඔහුගේ ගොවිපළේ ම සිදුකළ පසු ඇයට තවත් එහි සිටීමට සිත් දුන්නේ නැත. අරාරාත්ගේ මරණයත් තම දරුවාගේ ගබ්සා වීමත් මේ සියලුම මතකයන් එම නිවසේ ඇත. එයින් ඇත්වී යා යුතු යැයි ඈ සිතුවා ය. තම මව ජීවත් වූ යෙරෙවානයේ අසුර්මාන් වීදියේ පිහිටි නිවාසයට ඈ පැමිණියේ මේ නිසාවෙනි.

ඇය අලුත් ජීවිතයක් පටන් ගැනීමට නොසිතුවා ය. ඒත් ඒ වෙනුවට අරාරාත්ගේත්, දරුවාගේත් මතකයන් සමග ඇය ජීවත් වෙනු ඇත.

ජීවිතය කොයිතරම් අනපේක්ෂිත දෙයක් ද ?

තත්පරයක් වැනි ඇසිල්ලකින් බලාපොරොත්තු ප්‍රාර්ථනා සියල්ල ම සුනු වී යා හැකි සැටි. එය වේදනාවකි. කම්පනයකි.

ඒත් ජීවිතය එය නම් අපි එය බලාපොරොත්තු විය යුතු ය. එයත් සමග ජීවත් වීමට සිත හදා ගත යුතු ය. එමිලින් ද එසේ සිතුවා ය. ඇය ජීවත් වනු ඇත. මැරී ගිය වුන් අතර මැරී නොගිය මතකයන් සමග ඇය තවත් ජීවත් වනු ඇත.

ඇයගේ පියා කුඩා කල ම ඇයව හැරදා ගොස් තිබුණෙන් එයින් පසුව මව අසුර්මාන් වීදියේ පිහිටි මෙම නිවාසය මිලට ගෙන එහි පදිංචියට විත් තිබිණ.

එමිලින්ගේ ජීවිතයේ සතුට සම්පූර්ණයෙන් ම පහව ගොස් ඇත. ඇය මුලු දවස ම ඇයගේ කාමරයේ ගත කළා ය. එසේත් නැතහොත් අසුර්මාන් වීදියේ ම තිබුණු හලාබ්යාන් උද්‍යානයේ හුදකලාව කාත් කවුරුවත් නොමැති තැනක කල්පනා කරමින් සිටියා ය.

කාලය මෙසේ ගෙවී යද්දි තවත් අනපේක්ෂිත අසාමාන්‍ය දෙයක් සිදුවිය.

වෙඩි පහර නිසා එමිලින්ගේ දරුවා ගබ්සා වූ බවත් ඇය කෝමා තත්ත්වයෙන් රෝහල් ගත වී සිටි බවත් ඔබ හොඳින් දන්නේ ය. ඒත් දවස් කිහිපයක සිට ඇයට ඇයගේ කුස තුළ අමුත්තක් දැනිණ. වෙඩි උණ්ඩය නිසා පපු ප්‍රදේශය තුවාල වුණත් එම තුවාලය දැන් සුවපත් වී ඇත. එයින් කුසට බලපෑමක් සිදුවිය නොහැක. එසේ නම් මේ අමුතු හැඟීම කුමක්ද ? ඇය සිතුවා ය. එය වචනයෙන් විස්තර කළ නොහැකි ගුප්ත වූ අමුතු හැඟීමකි. කෙටියෙන් කිවහොත්,

"තවත් කෙනකු තම කුස තුළ ජීවත් වනු ඇතැයි" ඇය සිතුවා ය.

කෙමෙන් කෙමෙන් මෙම හැඟීම ඇයට ප්‍රත්‍යක්ෂ වෙද්දී ඇය මේ ගැන සොයා බැලීමට තීරණය කළා ය. හරියට ම එයට සතියකට පසු ඇය රෝහලට ගියා ය. ඇයව ස්කෑන් පරීක්ෂාවට ලක් කළ වෛද්‍යවරිය ඇය දෙස බලා මෙසේ ඇසුවා ය.

"මිසිස් එමිලීන් දරුවව ගබ්සා වුණා කිව්වා නේද ?"

"ඔව්" ඇය කීවා ය.

"ඒත් ඔයාගේ කුසේ දරුවෙක් නිරෝගීව වැඩෙනවා"

"මොනවා"

එමිලීන්ගේ දෑස විශාල වී ගියා ය. ඇයගේ හෘදය වේගයෙන් ගැහෙන්නට පටන් ගත්තා ය. ඇයගේ දෑස කඳුළින් පිරී ගියා ය.

"ඔව්... මම හිතන්නේ මිසිස් එමිලීන්ට දරුවන් දෙන්නෙක් ව ලැබෙන්න ඉඳලා තියෙනවා. එක දරුවෙක්ව ගබ්සා වුණත් අනිත් දරුවාට කිසිම හානියක් වෙලා නැහැ. ඒ දරුවා තවමත් කුස තුළ හොඳින් වැඩෙනවා, මේ බලන්න."

වෛද්‍යවරිය එමිලින් ඉදිරියේ ඇයගේ කුසෙහි ස්කෑන් ඡායාරූපය තැබීය.

එය දුටු එමිලීන්ගේ දෑසින් ඇය මෙතෙක් සිරකරගෙන සිටි කඳුළු එක්වර ම එලියට පැන්නා ය. ඇය හඬන්නට පටන් ගත්තා ය.

"දෙවියනේ....."

ඒ වචනය හැරෙන්නට ඇයට වෙන කිසිවක් කීමට හැකියාව නොතිබිණ. ඇයගේ මුළු සිරුර ම සතුටින් සහ වික්ෂිප්ත බවින් ගල් ගැසී තිබිණ.

වසර 08කට පසුව

"ගෝර්... පුතා කොහේද ඔයා... ගෝර්"

එමලින් නිවසින් එලියට විත් වටපිට බැලුවා ය. නිවසේ ඇති කුඩා උද්‍යානය පුරා ගෝර්ව සෙවු ඇය ඔහු එතන නිශ්චිතව ම නැති බව දැනගත්තා ය.

ඇයගේ පපුව ගැහෙන්නට විය. ගෝර් නිවස තුළත් නොවී ය. ඇය වේගයෙන් ලැලි ගේට්ටුව දෙසට දිව ගියා ය. එය අඩක් විවෘත කොට තිබිණ. ගේට්ටුවට එහායින් කුඩා අඩි පාරක් ඇත. නිතර නිතර මිනිසුන් යනෙන මෙම අඩිපාරේ සමහරක් විටෙක වාහන ද යන්නට වූයෙන් ඇය වඩාත් තැති ගත්තා ය. ඇය ගේට්ටුවෙන් පිටතට දුව ගොස් අඩි පාර දෙපස බැලුවා ය.

ගෝර් එම අඩි පාරේ ම වූ තණකොළ වැවුණු කුඩා තීරුවේ බිම ඉඳගෙන සිටියි.

"ගෝර් මොනවද ඔතන කරන්නේ " ඈ කෑගැසුවා ය.

ගෝර්ගෙන් පිළිතුරක් නොවී ය.

ඇය ගෝර් ළඟට ළං විය. ඔහු අඩි පාරට දිව ගොස් එහි සිටි ගොළුබෙල්ලන් කිහිප දෙනකුව ගෙන විත් කුඩා තණකොළ තීරුවේ කෙළවරින් තැබුවේ ය. එසේ තැබූ ඔහු යළිත් අඩි පාර මායිමට ගොස් තවත් ගොළුබෙල්ලෙක්ව ගෙනවිත් එයින් ම තැබීය.

"මොනවද ගෝර් ඔය කරන්නේ "

ඔහු දෙස මොහොතක් බලා සිටි එමලින් යළිත් ඇසුවා ය. ඔහු ගොළුබෙල්ලන්ව අඩි පාරෙන් ගෙනැවිත් තණකොළ පිස්ස මත තබන්නේ ඇයි දැයි ඈ සිතුවා ය.

"අම්මට පේන්නේ නැද්ද ගොළුබෙල්ලෝ පාරට ගියා ම පාරේ යන මිනිස්සුන්ගේ කකුල්වලට පැගිලා මැරෙනවා"

ඔහු එමිලින්ට ඔහුගේ කුඩා අත දිගු කර අඩි පාර පෙන්වීය.

"අර"

අඩි පාර මැද ගොළුබෙල්ලන් චප්ප වී මැරී ඇත. ගිම්හාන කාලයේ දී ගොළුබෙල්ලන් එමිලින්ගේ නිවසෙහි ඉදිරියේ තිබුණු අඩි පාරට එහායින් ඇති කුඩා වන ලැහැබේ සිට තෙත් බිමක් සොයමින් මාවතේ මෙහා පස වූ තණකොළ තීරුව දෙසට ඇදෙයි. මේ වන විටත් එසේ සංක්‍රමණය වෙමින් සිටි ගොළුබෙල්ලෝ බොහෝමයක් මාවතේ යනෙන මිනිසුන්ගේ පාදයනට පැගී මිය ගොස් සිටියෝ ය.

එමිලින් ගෝර් දෙස බැලුවා ය. කුඩා වුණත් ඔහුගේ සිතේ ඇත්තේ ඉමහත් වූ කරුණා ගුණයකි. ඇය සතුටු වූවා ය.

"ඉන්න මමත් පුතාට උදව් කරන්නම්"

කියූ ඇය ගෝර් සමග ම එකතු වී පාරේ සිටි ගොළුබෙල්ලන්ව තණකොළ සහිත මාවත් තීරුවට ගෙන ආවා ය.

කාරුණික සේ ම ගෝර්ට තිබුණේ ඉතාමත් ප්‍රියමනාප රූපයකි. ඔහු තරම් ඉතාමත් ශෝබන දරුවකු මුළු අසුර්මාන් වීදියේ ම නොමැති තරම් විය. ඔහුගේ සම වයසේ ළමුන් මෙන් ඔහු උස් නොවී ය. ඒත් ඔවුනට වඩා ඉතාමත් හික්මුණු ශාන්ත රූපයකින්

ඔහු යුක්ත විය.

ඔහුගේ නළල පළල් ය. දෙනෙත් ලා කොළ සහ නිල් මිශ්‍රිත වූ අමුතු ම ආලෝකමත් දෑසකි. ඒත් ඔහුගේ වඩාත් ම ආකර්ෂණීය අංගය ඔහුගේ කෙස්කලබ වන්නට ඇත. එය දඹ රන් පැහැයෙන් යුක්ත විය.

***

කලින් කීවාක් සේ ම ඔහුට තිබුණේ ඉතාමත් ම ශාන්ත හික්මුණු මුහුණකි. ඔහු සිනහසෙන විට ලැජ්ජාශීලී ගතියකින් යුක්ත වූ අතර ඒ නිසා ම ඔහුගේ මුහුණට අහ්ලාද්මක සිරියාවන්ත කමක් ලැබිණි.

ගෝර්ට වයස අවුරුදු 8ක් සම්පූර්ණ වී තිබුණ නිසාවෙන් ඔහුව පෙර පාසැලෙන් උසස් පාසැලට ඇතුළත් කළ යුතු විය. අසුර්මාන් වීදියේ ම තිබුණු "බුසෝෆ්" පාසලට එමිලින් ඔහුව ඇතුළත් කිරීමට සිතුවා ය.

බුසෝෆ් පිහිටා තිබුණේ එමිලීන්ගේ නිවසේ සිට මීටර් සියයක පමණ දුරිනි. ඒ නිසා ම එය පාසැලට යාමට සහ ඒමට වඩාත් පහසු විය.

පාසැලේ විදුහල්පතිතුමා සමග කතා කරගත් එමලීන් තම දරුවාව බුසෝෆ් පාසලට ඇතුළත් කිරීමට සියලු කටයුතු සූදානම් කොට තිබිණ. ගෝර් ද මෙයට දැඩි සේ ඇලුම් කළේ ය. බැල්කනියේ සිට බුසෝෆ් පාසලට යනෙන ළමයින් දෙස බලා සිටින ඔහු විටින් විට එමලින්ගෙන් පාසල ගැන ප්‍රශ්න අසන්නට පටන් ගත්තේ ය.

"ඔයාටත් තව ටික කාලෙකින් ම බුසෝෆ් ඉස්කෝලෙට යන්න පුළුවන් "

දවසක් ඈ ඔහුට කීවා ය.

එතැන් පටන් ගෝර්ගේ මනසේ බුසෝෆ් යාමට ආශාවක් වර්ධනය විය.

ඔහු නියමිත දිනය එනතුරු නොඉවසිල්ලෙන් පසුවිය. පාසැලේ දී තමන්ට යහළුවන් ගොඩක් මුණගැසෙනු ඇත. අනික බුසොෆ් උසස් පාසලකි. එය පෙර පාසලට වඩා විශාල ය, සිසුන් බොහෝමයක් ඇත.

"අම්මේ මීරාත් ඉස්කෝලේ එනව ද? "

ඔහු වරක් එමිලින්ගෙන් ඇසීය.

මීරා යනු අසුර්මාන් වීදියේ ම එමිලින්ගේ නිවසට නිවෙස් තුනකට ඈතින් ජීවත් වූ පවුලක සිටි ගෝර්ගේ ම වයසේ ගැහැනු ළමයෙකි. නිවෙස් අසල වූ තුමෝ උද්‍යානයේ දී ගොර් මීරා සමග යාළු විය. එතැන් පටන් ගෝර් සහ මීරා සෙල්ලං කළේ එකට ය. උද්‍යානයේ හමුවීමෙන් පසුව ඔවුන් හොඳ යහළුවන් බවට පත් වී තිබිණ. එතැන් පටන් ගෝර් මීරාගේ නිවසට ගොස් සෙල්ලං කළේ ය. සමහර විට ඇය ඔහුගේ නිවසට පැමිණියා ය.

පාසැලට මීරාත් එන බව ඇසීම ම ගෝර්ට පුදුමාකාර සතුටක් විය. මීරා සහා අලුතින් මුණගැසෙන අලුත් යහළුවන් සමග තමන්ට සෙල්ලන් කිරීමට ලැබෙනු ඇත.

බුසොෆ්

ගෝර් පාසල් යායුතු දිනය පැමිණියේ ය. එමිලින් බුසොෆ් පාසැලේ විදුහල්පති වූ එරික් මහතා සමග කතා කොට මෙම දිනය යොදාගෙන තිබිණ.

ගෝර් පාසැල් යාමට දවසකට පෙර සිට ම සූදානම් වූවේ ය. එමිලින් ඔහුට කුඩා නමුත් විචිත්‍රවත් පාසැල් බෑගයක් ලබා දී තිබුණා ය. අවුරුදු ගණනක් භාවිතා කළ පෙර පාසැල් බෑගය වෙනුවට අලුත් ම බෑගයක් ලැබීම ගැන ගෝර් ඉමහත් සේ සතුටු විය. පාසැලට අවශය අභ්‍යාස පොත් එහි ගබඩා කළ ගොර් පාසැල් යන මොහොත වන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියේ ය.

***

පසුදින උදෑසන ම ඔහු අවදි විය. එමිලීන් ඔහුව අවදි කළේ නැත. එමිලින් අවදි වන විටත් ඔහු අවදි වී සිටියේ ය. ඒ තරමට

ම පාසැල ඔහුගේ සිත ප්‍රබෝධමත් කොට ඇත. තම පුතාගේ මේ උනන්දුව දුටු එමිලින් එයින් බොහෝ සෙයින් ප්‍රීතියට පත් වූවා ය.

මෙම විශේෂ වූ දිනයේ දී එමිලින්ගේ මව "මරීටා" තම දිනචරියාව ගත කළ ආකාරය ගැනත් මඳක් පැවසිය යුතු ය.

මරීටා 65 වන වියේ පසු වුවා ය. ඇයගේ වයසේ සමහරක් කාන්තාවන් ඉතාමත් නීරෝගිමත් ව සිටියත් ඇය බොහෝ සෙයින් ම කෙට්ටු දුර්වල කාන්තාවක් විය. ඇය ඇවිදින විට ඇයගේ බෙල්ලට පහළ කොටස කුදු කොට ඇය ඇවිද්දා ය.

එදින උදෑසන ම ඇය පල්ලියට යන්නට පිටත් විය. ඇය සෑම ඉරිදාවක ම පල්ලියට යන මුත් එදින ඇය පල්ලියට යන්නට සිතුවේ ගෝර් වෙනුවෙනි.

ලුසාවෝර් පල්ලිය පිහිටියේ නිවසට මඳක් ඈතිනි. ඇය ඒ දුර පයින් ඇවිද ගියා ය. පල්ලියට ගිය ඈ ගෝර් වෙනුවෙන් දෙවියන් වැන්දා ය. ඔහු පාසැල් යන මුල් ම දිනය නිසාවෙන් ඩ්‍රෑම් සියයකට ඉටිපන්දමක් මිල දී ගත් ඇය ඔහු වෙනුවෙන් එය පල්ලි අල්තාරයෙහි පත්තු කළා ය.

ගෝර්ව සූදානම් කරගත් පසුව එමිලින් ගෝර්වත් කැටුව පාසල වෙත ගියා ය.

බුසෝන් විශාල පාසැලකි. පැරණි සෝවියට් සමයේ ඉදිකරනු ලැබූ සිමෙන්ති කම්හලක් සෝවියට් සමුහාණ්ඩුවේ වෙන්වීමෙන් පසුව අත හැර දමනු ලදුව එය එතැන පාසැලක් මෙන් ඉදිවී තිබිණ. මුල් ම කාලයේ මෙය ප්‍රාථමික අංශ දරුවන් වෙනුවෙන් පමණක් ආරම්භ කොට ඇති අතර පසුව අසුර්මාන්වල ජනගහනය වැඩී වීමත් සමග ම සියලුම වයස්වල සිසුන් සඳහා මෙය විවෘත කරන ලදී.

ප්‍රාථමික අංශයේ පංතිය ඉදිරිපිටට ගිය එමලින් එහි ප්‍රධාන ද්වාරය අසල හිටගත්තා ය. ඒ වන විටත් පංති කාමරය තුළ

ළමුන් විස්සකට ආසන්න ප්‍රමාණයක් සිටි අතර ඔවුන් සියල්ල ම ගෝර්ගේ වයසේ කුඩා දරුවන් ය. පංතියට ඔළුව දමා තවමත් ගුරුතුමිය පැමිණ නොමැති බව නිශ්චිතව ම දැනගත් එමලින් ඇය එනතුරු නැවතී සිටියා ය. ගෝර් පංතියේ සිටි අනිත් සිසුන් දෙස බැලීය. ඔවුහු සියල්ල ම විවිධාකාර වූ විචිත්‍රවූර්ත ඇඳුම්වලින් සැරසී සිටියෝ ය.

(අසුර්මාන් පාසැල් සිසුන්ට ආවෙනික වූ වෙන ම නිල ඇඳුමක් නොතිබුණෙන් තමන්ට රිසි ඇඳුමක් ඇඳගෙන පැමිණීමට ඔවුනට අවසරය ඇත.)

ගෝර් පංති කාමරය ඉදිරියෙහි හිටගෙන සිටිනු දුටු කුඩා ගැහැනු ළමයෙක් පංති කාමරයේ සිට දුවගෙන විත් ඔහු අසල නතර විය. ඇයව දුටු විගස ම ගෝර්ගේ දෙනෙත් විශාල විය.

"මීරා " ඔහු කීවේ ය.

"ඔයත් මගේ පංතියට ද එන්නේ " ඈ ඇසුවා ය.

"ඔව් " ගෝර් පිළිතුරු දුන්නේ ය.

ඇය සිනාසුණා ය. ඇයගේ කටෙහි ඉදිරිපස දත් සියල්ල ම පාහේ භාගයට කැඩී තිබුණෙන් එය ඇයගේ මුහුණට හාස්‍යක් ගෙන දුන්නා ය.

ඈතින් එන රුවක් දුටු එමිලීන් ඒ දෙස බැලුවා ය. වයස අවුරුදු 45ක පමණ උස කාන්තාවක් පංති කාමරය දෙසට පැමිණෙමින් සිටියා ය. ඇයගේ ස්වරූපයෙන් ම ඒ පංති භාර ගුරුතුමිය විය යුතු යැයි සිතූ එමිලීන් මීරා දෙස බලා,

"දුව පංතියට යන්න අන්න ටීච එනවා"

යැයි කීයෙන් මීරා ටීච දෙස බලා භීයක වේගයෙන් පංති කාමරය තුළට දිව ගියා ය.

කොරිඩෝව දිගේ පැමිණි පංතිභාර ගුරුතුමිය එමිලින් අසල නතර විය.

"මේ පුතා වෙන්න ඕනේ, අද නේද මුලින් ම පංතියට එන්නේ"

ගෝර් ඇය දෙස බලා සිනාසුණේ ය.

මොකක්ද පුතාගේ නම ඈ ඇසුවා ය.

"ගෝර්" ඔහු කීවේ ය.

"පුතාට මම අඬගැහුව ම පංතිය ඇතුළට එන්න ඕනේ හරි ද?"

"හා" ගෝර් හිස වැනී ය.

ගුරුතුමිය පංතිය තුළට ගොස් පංතියේ සිටි දරුවන්ට

"සුභ උදෑසනක්" යැයි කීයෙන් සියල්ලෝ ම එක්වර ම "සුභ උදෑසනක් යැයි කෑ ගසා කීවෝ ය.

"ඔන්න දරුවනේ අද ඔයාලත් එක්ක අලුත් යහළුවෙක් එකතුවෙන්නයි යන්නේ "

කී ඈ ගෝර් දෙස බලා,

"මෙහෙට එන්නැ'යි" සං කළෙන් ගෝර් ගුරුතුමිය වෙතට ආවේ ය.

"මේ ඉන්නේ ගෝර්" ඇය පංතියේ අනිත් දරුවන් ඉදිරියෙහි ගෝර්ව හඳුන්වා දුන්නා ය.

ගුරුතුමිය ගෝර්ව පංතියේ ළමුන්ට හඳුන්වා දුන් පසුව ඇය ඔහුව පංති කාමරයේ මැද පේළියේ තිබුණු බංකුවක් වෙතට ගෙන ගොස් ඉන්දුවා ය.

"අද ඉඳන් මේක තමයි පුතාගේ ඩෙස්ක් එක.. හැමදාම පංතියට ආව ම පුතා මෙතන තමා ඉඳගන්න ඕනේ තේරුණා ද? " ඇය ගෝර්ගේ හිස අතගාමින් ඇසුවා ය.

"ඔව්" ගෝර් හිස වැනී ය.

යළිත් පංතියේ ගුරු මේසයට ආ ඇය පුටුවෙහි ඉඳගන්නා ගමන් දොර ළඟ සිටි එමිලින් දෙස බලා ඇයට පාසලෙන් පිටත් වී යන ලෙස දැන්වුවා ය. එමිලින් ගෝර් දෙස බලා සිනාසි හාද්දක් දෙන්නට මෙන් තොල් උළුක් කර පෙන්විය. ගෝර් සිනාසුණේ ය.

තමන් ළඟ කුඩා කල සිට හැදී වැඩුණු දරුවාව පැය කිහිපයකට හෝ පාසැලේ තනිකොට නිවෙසට යාම මවකට ඉතාමත් ම අපහසු කාර්යයකි. ඒත් එමිලින් ඒ වෙනුවෙන් සිත හදාගත්තා ය. කිසිම දරුවකුව සදාකාලිකව ම තම තුරුලෙහි තබා ගත නොහැකි බවට සෑම මවක් ම මුලින් ම තේරුම් ගන්නේ මෙම දිනයේ

දී ය. ඇයගේ නෙතට කඳුළු ආවා ය. ඒවා මනසින් ම පිස දා පංතියේ ඔහුගේ මුල් ම දිනය ගතකරන්නට යන තම දරුවා දෙස මොහොතක් බලා සිටි ඈ, පංති කාමරයෙන් පිටවී ආවා ය.

***

එමිලින් යළිත් නිවසට පැමිණෙන විට නිවසෙහි ගේට්ටුවත්, දොරත් විවර කර තිබූ එයින් කුමක් හෝ දෙයක් සිදුවී ඇතැ'යි ඈ නිකමට මෙන් සිතුවා ය. අරාරාත්ගේ මරණයෙන් පසුව ඇය කුඩා දේටත් තැති ගත්තා ය. මෙවැනි අසාමාන්‍ය දේවල් දුටු විට දී ඒ තැතිගැන්ම ඉතාමත් සීඝ්‍ර සහ වේගවත් විය. තම මව නිවසට පැමිණියා නම් නිවසේ දොර වසා තැබිය යුතු ය. ඇය නිවස තුළට දිව ගියා ය.

ඇයගේ මව නිවසේ මැද සාලයෙහි වැටී සිටියා ය. එමිලින් ඇය ළඟට දිවගොස් ඇයව ඔසවා තම ඔඩොක්කුවට ගත්තා ය.

ඇයට තවමත් ප්‍රාණය ඇත. නිසැකව ම ඈ සිහිසුන් වන්නට ඇත. ඇය මවව සාලයෙහි වූ පුටුවේ ඉන්දවා ඇයගේ මුහුණට තට්ටු කළා ය. මරීටා ඉතාමත් ආයාසයකින් යුක්තව දෙනෙත් විවර කළා ය.

"මොකක්ද අම්මට වුණේ "

"දන්නේ නැහැ දුවේ.. පල්ලියට පයින්ම ගිය නිසා ප්‍රෙෂර් එක වැඩි වෙන්න ඇති. "

ඇය කෙඳිරුවා ය...

විස්සි

බුසොෆ් පාසල ස්වභාව ධර්මයෙන් පිරීපුන් වූ පාසැලකි.

වටේට ම විශාල පන් ගස් වැවී තිබුණු අතර බොහෝ විට පාසලේ සංගීතය, කලාව වැනි සෞන්දර්ය විෂයයන් ඉගැන්වුවේ ගස් කොළන්වලින් වැසී ගිය එලිමහන් බිම් කඩේ ය. එය එවැනි

විෂයන්වලට දරුවන්ව උත්සුක කිරීමට අපූරු තෝතැන්නක් විය.

පංතියේ සියලුම දරුවන්ව ද රැගෙන සංගීත ගුරුතුමිය පාසැලේ එහා කෙළවරේ තිබුණු "පුංචි දිය ඇල්ල" නමින් දරුවන් අතර ප්‍රසිද්ධ වූ කුඩා නමුත් අඩි තුනක පමණ උසක සිට ගලාගෙන හැලෙන දිය ඇල්ලක් පිහිටා තිබුණු තැනකට ආවා ය.

ගලාගෙන යන කුඩා වතුර පාර නිසාවෙන් මෙම ස්ථානය මඳක් සීතලෙන් යුක්ත විය. ගිම්හාන කාලයේ දී මෙම ස්ථානයේ ඉඳගෙන දරුවන්ට පාඩක් කියා දීමට ගුරුවරුන් ප්‍රිය කළේ මෙහි තිබුණු ඉතාමත් නිස්කලංක සහ සෞම්‍ය භාවය නිසාවෙනි... දිය ඇල්ල අසලම, කපා තිබූ අඩි දෙකක් පමණ උස පයින් මුලක් වටා, පුටු තබා දරුවන්ට ඉඳගැනීමට හැකි වන ආකාරයෙන් සකස් කර ඇත.

ගුරුතුමිය ළමුන්ට මැදිව එම කපා දමා තිබුණු පයින් ගස් කඳෙහි ඉඳගත්තා ය. එසේ ඉඳගත් ඇය තමා වටා සිටි දරුවන් දෙස උවමනාවෙන් බැලුවා ය. සියල්ලෝ ම පාඩමට සූදානම් වී සිටියෝ ය.

පංතියේ සිටින වදකාර ම ළමයාව ගුරුවරුන්ගේ මනසින් අහක් වෙන්නේ නැත. ඔහු කිසියම් තැනක නැත්නම් එය නිසැකව ම ඔවුන්ගේ මනසට ඉබේ ම මෙන් කා වදිනු ඇත.

"කෝ වින්සි" ඇය එක්වර ම ඇසුවා ය.

ළමුන් සමහරක් එකිනෙකා දෙස බැලූ අතර තවත් සමහරක්

"වින්සි " යන නම ඇසෙද්දි එය ගණනකටවත් ගත්තේ නැත.

"එයා පංතියේ ඇති"

එක් ළමයෙක් ඉතාමත් බයාදු හඬින් ඇසෙන නොඇසෙන ගාණට කීවේ ය.

ගුරුතුමිය ළමුන් එකිනෙකා දෙස ඉතාමත් තියුණු බැල්මක් හෙළී ය.

"කෝ කවුරු හරි ළමයෙක් ගිහින් වින්සිට එන්න කියන්න" ඇ කීවා ය.

කිසිවකුත් තමන් ඉඳගෙන සිටි බංකුවෙන් හිටගත්තේවත් නැත.